# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය

**ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධ සංගීත ගාන්ධර්වයාණන් ලෙස හඳුන්වන නැසීගිය පණ්ඩිත් වණ්ණකුවත්තවඩුගේ දෙන් අමරදේවයන්ට කෘතඥතාව පළකිරීම සඳහා "අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය" ලෙස නම් කර ඇති සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රයක් පිහිටුවීම පිණිස ද; එහි පරමාර්ථ හා බලතල නිශ්චිතව දැක්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

---

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් 2018 ජූලි මස 18 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2018 ජූනි මස 14 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[258 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 23.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය

එල්.ඩී.—ඕ. 46/2017

**ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධ සංගීත ගාන්ධර්වයාණන් ලෙස හඳුන්වන නැසීගිය පණ්ඩිත් වණ්ණකුවත්තවඩුගේ දෙන් අමරදේවයන්ට කෘතඥතාව පළකිරීම සඳහා "අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය" ලෙස නම් කර ඇති සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රයක් පිහිටුවීම පිණිස ද; එකී පරමාර්ථ හා බලතල නිශ්චිතව දැක්වීම පිණිස ද; ඒ හා සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මෙම පනත 2018 අංක    දරන අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය පිහිටුවීම.

2. (1) පර්යේෂණ විද්‍යාගාරයකින්, ලේඛනාගාරයකින්, පුස්තකාලයකින් සහ කෞතුකාගාරයකින් සමන්විත (මෙහි මින්මතු ''කේන්ද්‍රය'' යනුවෙන් සඳහන් කරනු ලබන) අමරදේව සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රය නැතහොත් අමරදේව අසපුව යනුවෙන් හඳුන්වන සෞන්දර්ය හා පර්යේෂණ කේන්ද්‍රයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කේන්ද්‍රය (1) වන උපවගන්තිය යටතේ ඊට පවරන ලද නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු අතර, ඒ නාමයෙන් කේන්ද්‍රය විසින් ද, කේන්ද්‍රයට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය.

කේන්ද්‍රයේ පොදු පරමාර්ථ.

3. සංස්ථාපිත මණ්ඩලය පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා වේ:—

(අ) කේන්ද්‍රයේ උපකරණ සුරක්ෂිත කිරීම සහ ලේඛනාගාරගත කිරීම;

(ආ) සෞන්දර්ය අධ්‍යයනයන් පිළිබඳ වන උපාධි හා පශ්චාත් උපාධි පාඨමාලාවන්හි පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැළසීම; සහ

(ඇ) (මෙහි මින්මතු ''ඩබ්ලිව්. ඩී. අමරදේව'' යනුවෙන් සඳහන් කරනු ලබන) නැසීගිය පණ්ඩිත් වණ්ණකුවත්තවඩුගේ දොන් අමරදේවයන්ගේ සංගීත ශෛලිය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩමුළු, දේශන සහ රසාස්වාදන වැඩසටහන් හෝ වෙනත් යම් උත්සව පැවැත්වීම.

අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක් ආදියේ කාර්ය සමග කේන්ද්‍රයේ කාර්ය ගැටුම් ඇති නොවන බවට කේන්ද්‍රය සහතික විය යුතු බව.

**4.** රජයේ යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් හෝ යම් පළාත් සභාවක් හෝ ''අමරදේව පදනම'' විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ කේන්ද්‍රයේ කාර්ය අතර කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් කේන්ද්‍රයේ පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය.

**5.** (1) මධ්‍යස්ථානයේ කටයුතු පරිපාලනය කිරීම හා කළමනාකරණය (මෙහි මින්මතු ''මණ්ඩලය'' යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත පැවරෙනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය:—

(අ) නිල බලයෙන් පත්වන සාමාජිකයන්:—

(i) උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරන ලද අමාත්‍යාංශ නියෝජිතයකු;

(ii) තත්කාලය සඳහා කේන්ද්‍රය පවරන ලද අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරන ලද නියෝජිතයකු;

(iii) ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහු විසින් නම් කරන ලද යම් තැනැත්තකු;

(iv) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපතිවරයා හෝ ඔහු විසින් නම් කරන ලද යම් තැනැත්තකු;

(v) ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරන ලද යම් තැනැත්තකු; සහ

(vi) සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා හෝ ඔහු විසින් නම් කරන ලද යම් තැනැත්තකු.

(ආ) නම් කරනු ලැබූ හෝ පත් කරනු ලැබූ සාමාජිකයන්:—

(i) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයකු;

(ii) අගමැතිවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයකු;

(iii) විමලා අමරදේව, රංජන අමරදේව, ප්‍රියංවද අමරදේව සහ සුභානි අමරදේව නමින් වූ නැසීගිය ඩබ්ලිව්. ඩී. අමරදේවයන්ගේ පවුලේ සාමාජිකයන්;

(iv) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද ''අමරදේව පදනම'' විසින් නම් කරන ලද සාමාජිකයකු; සහ

(v) ''අමරදේව පදනම'' සමග එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් පත් කරන ලද, සෞන්දර්ය හා සාහිත්‍ය ක්ෂේත්‍රයන්හි අත්දැකීම් ඇති සහ හැකියාව පෙන්වා ඇති සාමාජිකයන් හතරදෙනකු.

(3) ජනාධිපතිවරයා විසින්, මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් එක් අයකු මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් පත් කරනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) හෝ (ii) වන අනුඡේද යටතේ පත්කරනු ලැබූ සාමාජිකයකු, මියයාම, ඉල්ලා අස්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ඇතිවන පුරප්පාඩුවක්, අවස්ථාවෝචිත පරිදි ජනාධිපතිවරයා හෝ අගමැතිවරයා විසින් පුරවනු ලැබිය යුතු ය. පුරප්පාඩුවක් පිරවීමට එසේ පත් කරනු ලැබූ යම් තැනැත්තකු විසින් පූර්වප්‍රාප්තිකයාගේ ධුර කාලයේ ඉකුත් නොවූ කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(5) (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iii) වන අනුඡේදය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු, මියයාම, ඉල්ලා අස්වීම හෝ

ධුරයෙන් ඉවත් කිරීම නිසා පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, දැනට සිටින පවුලේ සාමාජිකයන්ගෙන් බහුතරයකගේ එකඟත්වය ඇතිව අනුප්‍රාප්තික සාමාජිකයකු පත් කරනු ලැබිය යුතු අතර, එකී නාමිකයා අනිවාර්යයෙන්ම නැසීගිය පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේවයන්ගේ පවුලේ සාමාජිකයකු විය යුතු නොවේ:

එසේ වුවද, පවුලේ සාමාජිකයන් කිසිවකු මණ්ඩලයේ ඉතිරිව නොමැත්තේ නම්, මණ්ඩලයේ සාමාජිකයන්ගෙන් බහුතරයකගේ එකඟත්වය ඇතිව අනුප්‍රාප්තික සාමාජිකයා පත් කරනු ලැබිය යුතු ය.

(6) (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (iv) හා (v) අනුඡේද යටතේ පත්කරනු ලැබූ සාමාජිකයකු, මියයාම, ඉල්ලා අස්වීම හෝ සාමාජිකයකු වශයෙන් ධුරය අවසන් වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ඇතිවන පුරප්පාඩුවක්, අවස්ථාවෝචිත පරිදි මණ්ඩලය විසින් අමරදේව පදනමෙන් සාමාජිකයකු නම් කිරීම මගින් හෝ සාමාජිකයකු පත් කිරීම මගින් ධුර කාලයේ ඉකුත් නොවූ කාලය සඳහා පුරවනු ලැබිය යුතු ය.

(7) අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට කේන්ද්‍රයේ අරමුදලින් මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය.

**6.** (1) 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වන ලද සියලුම සාමාජිකයන්, නම් කරන ලද හෝ පත් කරන ලද දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය:

එසේ වුව ද, යම් නම් කරන ලද හෝ පත් කරන ලද සාමාජිකයකු ඔහුගේ ධුර කාලය ඉකුත්වීමට පෙර ධුරය පුරප්පාඩු කරනු ලබයි නම්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින්, ඔහු විසින් කලින් ධුරය පුරප්පාඩු කළහොත් මිස, පූර්වප්‍රාප්තිකයාගේ ධුර කාලයේ ඉකුත් නොවූ කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(2) මණ්ඩලයේ සභාපතිවරයා හෝ වෙනත් යම් සාමාජිකයකු රෝගාතුරවීම, අබලතාවයකට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව

සිටීම නිසා ඔහුට මාසයකට නොඅඩු කාලයකට තම ධුරයේ කාර්ය ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවට වැඩ බැලීම සඳහා 5 වන වගන්තියේ විධිවිධාන පිළිබඳව සැළකිලිමත්ව, වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලය.

7. (1) මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා එහි ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර මණ්ඩලය විසින් ඔහුව පත් කරනු ලැබිය යුතු ය.

(2) කේන්ද්‍රයේ නිලධරයන්ගේ සහ සේවා නියුක්තිකයන්ගේ සාමාන්‍ය කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ, අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතු ය.

(3) මධ්‍යස්ථානයේ කළමනාකරණය හා පරිපාලනය සඳහා අවශ්‍ය නිලධරයන්ගේ සහ සේවා නියුක්තිකයන්ගේ සංඛ්‍යාව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා මණ්ඩලය විසින් තීරණය කරන ලද පාරිශ්‍රමික ඔවුනට ගෙවනු ලැබිය යුතු ය.

කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය නිලධරයන් පත් කිරීම.

8. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට රාජ්‍ය සේවයේ යම් නිලධරයකු ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත සහිතව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කාලයක් සඳහා කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය; නැතහොත් එවැනිම කැමැත්තක් ඇතිව, එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයා සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරන ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වෙමින් ආණ්ඩුව සමග ගිවිසුමකට ඇතුළත් වූ යම් තැනැත්තකු

මණ්ඩලය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් කේන්ද්‍රයට සේවය කරනු ලබන යම් කාලසීමාවක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටුකිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක නිලධරයකු හෝ සේවකයකු, මණ්ඩලයේ ඉල්ලීම මත සහ එම සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ කැමැත්ත සහිතව, අවස්ථාවෝචිත පරිදි මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබීම හෝ එවැනිම කැමැත්තක් සහිතව, කේන්ද්‍රය විසින් සහ පළාත් පාලන සේවා කොමිෂන් සභාව හෝ පළාත් පාලන ආයතනය විසින් එකඟ විය හැකි පරිදි, විශ්‍රාම හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට සම්බන්ධ දේ ඇතුළත්ව, එවැනි නියමයන් හා කොන්දේසි මත එකී කාර්ය මණ්ඩලය සඳහා පත් කරනු ලැබීම සිදු කළ හැකි ය.

(6) මණ්ඩලයේ ඉල්ලීම පිට රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයකු හෝ සේවකයකු, එකී නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත සහ එම රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත සහිතව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි කාලසීමාවක් සඳහා කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලය සඳහා තාවකාලිකව තෝරා පත් කරගනු ලැබීම හෝ එවැනිම කැමැත්තක් සහිතව මණ්ඩලය විසින් සහ එම රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් එකඟ විය හැකි පරිදි, විශ්‍රාම හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම් සම්බන්ධ දේ ඇතුළත්ව, එවැනි නියමයන් හා කොන්දේසි මත එම කාර්ය මණ්ඩලය සඳහා ස්ථිර ලෙස පත් කර ගත හැකි ය.

(7) මේ වගන්තියේ (5) වන හෝ (6) වන උපවගන්ති යටතේ කේන්ද්‍රයේ කාර්ය මණ්ඩලය සඳහා යම් තැනැත්තකු තාවකාලිකව පත් කර ඇති අවස්ථාවක දී, එකී තැනැත්තා එම කාර්ය මණ්ඩලයේ වෙනත් සාමාජිකයකු හා සමාන විනය පාලනයකට යටත් විය යුතු ය.

කේන්ද්‍රයේ බලතල.

**9.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව පහත සඳහන් බලය කේන්ද්‍රයට තිබිය යුතු ය:—

(අ) නැසීගිය පණ්ඩිත් ඩබ්ලිව්. ඩී. අමරදේවයන්ගේ ළමාවියේ හා තරුණවියේ පොත්පත්, ලේඛන, ලිපිගොනු, ඡායාරූප, චිත්‍රපට, තැටි, ශ්‍රව්‍ය හා දෘශ්‍ය පට, වැදගත් පෞද්ගලික වස්තූන් හා ස්මාරකයන්, පෞද්ගලික අභිරුචියක් සහිත

ඔහුගේ නිර්මාණ හා එක්රැස් කිරීම්, තැන්පත් කරනු ලැබිය යුතු ඔහු ලද නිල පිළිරූ, ප්‍රදාන, තිළිණ හා ත්‍යාග පිළිගැනීම හා භාර ගැනීම සඳහා සහ එම උපකරණ ආරක්ෂා කිරීම හා ප්‍රදර්ශනය කිරීම සඳහා සියලු ක්‍රියාමාර්ග ගැනීම;

(ආ) කේන්ද්‍රයේ අරමුණු සඳහා අවශ්‍ය කරනු ලැබිය හැකි ඉඩම් හා ගොඩනැගිලි මිල දී ගැනීම, බද්දට ගැනීම, කුලියට ගැනීම සහ කේන්ද්‍රයේ පරමාර්ථ මුදුන්පත් කිරීමේ අරමුණින් සුදුසු යයි සැලකිය හැකි පරිදි එම ඉඩම් හා ගොඩනැගිලි පැවරීම, විකිණීම හෝ හුවමාරු කිරීම;

(ඇ) මෙහි නිශ්චිතව සඳහන් පරමාර්ථ සඳහා අවශ්‍ය කරනු ලබන යම් ගොඩනැගිල්ලක් ඉදිකිරීම හෝ අලුත්වැඩියා කිරීම;

(ඈ) ඇප සහිතව හෝ ඇප රහිතව අරමුදල් ණයට ගැනීම හෝ රැස්කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාරගැනීම සඳහා:

එසේ වුව ද, කේන්ද්‍රය වෙත කරනු ලබන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මණ්ඩලය විසින් මුදල් විෂයභාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයාගේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමැතිය ලබාගත යුතු ය;

(ඉ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගණුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීම, ලිවීම, ප්‍රතිග්‍රහණය, අවමිල කිරීම, පිටසන් කිරීම, ගණුදෙනු කිරීම, මිල දී ගැනීම, විකිණීම හා නිකුත් කිරීම සඳහා සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වසාදැමීම;

(ඊ) කේන්ද්‍රය විසින් නිශ්චය කළ හැකි පරිදි එවැනි ආකාරයෙන්, කේන්ද්‍රයේ අරමුණු සඳහා කඩිනමින් අවශ්‍ය නොවන යම් අරමුදල් ආයෝජනය කිරීම;

(උ) කේන්ද්‍රයේ පරමාර්ථ මුදුන්පත් කිරීමේ අරමුණින් යම් නීත්‍යානුකූල භාරයක් හෝ කේන්ද්‍රයේ යම් නිශ්චල හෝ පෞද්ගලික දේපල භාරගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ පරිපාලනය කිරීම;

(ඌ) කේන්ද්‍රයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි යෙදවීම, සේවයෙන් ඉවත් කිරීම හෝ සේවය

අවසන් කිරීම සහ ඔවුන් පිළිබඳ විනය පාලනය ක්‍රියාත්මක කිරීම සඳහා සහ කේන්ද්‍රය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වැටුප්, දීමනා හා පාරිතෝෂික ඔවුන් වෙත ගෙවීම;

(එ) කේන්ද්‍රයේ පරමාර්ථ මුදුන්පත් කිරීමේ අරමුණින් දේශන, වැඩමුළු, සම්මන්ත්‍රණ සංවිධානය කිරීම;

(ඒ) කේන්ද්‍රයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් දේශීය හෝ විදේශීය ආයතන සමග සම්බන්ධීකරණය කිරීම හෝ සම්බන්ධීකරණය වීම; සහ

(ඔ) කේන්ද්‍රයේ පරමාර්ථ නිසිආකාරයෙන් සහ ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හා සුදුසු වන වෙනත් සියලු දෑ සිදුකිරීම.

කේන්ද්‍රයේ රීති.

**10.** (1) මණ්ඩලය විසින්, මණ්ඩලයේ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන්නා වූ රීති, පහත සඳහන් සියලු කරුණු සඳහා හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යනුකූල විය යුතු ය:—

(අ) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකත්වය සම්බන්ධ වෙනත් යම් කරුණක්;

(ආ) මණ්ඩලයේ සාමාජිකයකු වීමට අවශ්‍ය සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඇ) කේන්ද්‍රයේ හෝ මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එකී රැස්වීමේ ගණපූරණය සහ මණ්ඩලයේ බලතල හා කාර්ය ඉටුකිරීම හා ක්‍රියාත්මක කිරීම;

(ඈ) කේන්ද්‍රයේ විවිධ නිලධරයන්ගේ නියෝජිතයන්ගේ සහ සේවා නියුක්තිකයන්ගේ පත්කිරීම්, බලතල, කාර්ය හා කර්තව්‍ය; සහ

(ඉ) කේන්ද්‍රයේ දේපළ, පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන්, එවැනි රැස්වීමක දී එවැනිම ආකාරයෙන් ම මණ්ඩලය විසින් සාදන ලද යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ රීති ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

(4) මණ්ඩලයේ සාමාජිකයන් සෑම කල්හිම කේන්ද්‍රයේ රීතිවලට යටත් විය යුතු ය.

කේන්ද්‍රයේ අරමුදල.

**11.** (1) කේන්ද්‍රයට (මෙහි මින්මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "අමරදේව අසපුව සංවර්ධන අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන එහිම අරමුදලක් තිබිය යුතු අතර, කේන්ද්‍රය සඳහා හා වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දයක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් මින් පෙර හෝ මින්මතුවට ලැබිය යුතු සියලුම මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරන එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක අරමුදලේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) කේන්ද්‍රයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී කේන්ද්‍රය විසින් දරනු ලබන වියදම් පියවීමට අවශ්‍ය සියලුම මුදල් කේන්ද්‍රයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

කේන්ද්‍රය විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**12.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, බද්දක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් කේන්ද්‍රය සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් කේන්ද්‍රයට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව 10 වන වගන්තිය යටතේ සාදන ලද කේන්ද්‍රයේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්යය සඳහා කේන්ද්‍රය විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

**මුදල් හෝ දේපළ යෙදවීම.**

**13.** කවර ආකාරයකින් හෝ ලබාගන්නා කේන්ද්‍රයේ මුදල් හා දේපළ, මෙයින් නියම කරන පරිදි එහි පරමාර්ථ ඉටු කර ගැනීම කෙරෙහි පමණක් යෙදවිය යුතු අතර එයින් කවර හෝ කොටසක් මණ්ඩලයේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද දීමනා, ලාභ හෝ වෙනත් කුමන හෝ ආකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

**විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.**

**14.** (1) කේන්ද්‍රය විසුරුවා හැරීමේ දී එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත් ඒ දේපළ මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, කේන්ද්‍රයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද එහි හෝ ඒවායෙහි රීති අනුව යම් ආදායමක් හෝ දේපලක් ඔවුන්ගේ සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද, වෙනත් යම් ආයතනයකට හෝ ආයතනයන්ට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය හෝ ආයතනයන් මණ්ඩලය විසුරුවා හැරීමට පෙරාතුවම මණ්ඩලයේ සාමාජිකයන් විසින් යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

**ගිණුම් විගණනය.**

**15.** (1) කේන්ද්‍රය විසින් එහි ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ කේන්ද්‍රයේ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(2) කේන්ද්‍රයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව ප්‍රකාර කේන්ද්‍රයේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් හෝ විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම්ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි ගණකාධිකාරි සමාගමක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව.

**16.** (1) මණ්ඩලය විසින් කේන්ද්‍රයේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහා සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමග ඒ වාර්තාව අදාළ වන වසරට පසුව එන වර්ෂයේ සය මාසයක් ඉකුත්වීමට පෙර තත්කාලයෙහි කේන්ද්‍රය පවරන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී කේන්ද්‍රය වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු අරමුදල් පිළිබඳ වෙනම ගිණුම් ප්‍රකාශයක් (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට ඇමිණිය යුතු ය.

කේන්ද්‍රයේ මුද්‍රාව.

**17.** (1) 10 වන වගන්තිය යටතේ සාදන ලද රීතින්හි සඳහන් කරනු ලැබිය හැකි යම් තැනැත්තන් සංඛ්‍යාවක් ඉදිරිපිට දී මිස කේන්ද්‍රයේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් තමන් පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) කේන්ද්‍රයේ මුද්‍රාව, 10 වන වගන්තිය යටතේ සාදන ලද රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි තැනැත්තන්ගේ භාරයේ තිබිය යුතු ය.

නියෝග.

**18.** (1) නියම කළ යුතු කාරණා වශයෙන් මේ පනතින් නියමිත සහ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යාවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක්ම, *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පසු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ සෑම නියෝගයක්ම, එය *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දින සිට මාස තුනක කාලයක් තුළ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) පාර්ලිමේන්තුව විසින් නියෝගය අනුමත කරනු ලැබූ දිනය නිශ්චිතව සඳහන් කරන දැන්වීමක් *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය. පාර්ලිමේන්තුව විසින් එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් ඒ අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු ය.

ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**19.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අර්ථ නිරූපණය.

**20.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ පනතේ-

"සෞන්දර්ය විද්‍යාව" යන්නෙන්, සංගීත, නැටුම්, චිත්‍ර, මූර්ති කලාව ඇතුළත් ලලිත කලාවන් ද, කාව්‍යයන්, කෙටිකතා, නවකතා ඇතුළත් සාහිත්‍ය කලාවන් ද, චිත්‍රපට ක්ෂේත්‍රයේ යම් ක්‍රියාකාරකමක් ද; සහ

"අමාත්‍යවරයා" යන්නෙන්, කේන්ද්‍රය භාර අමාත්‍යාංශයේ අමාත්‍යවරයා ද,

අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**21.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.